// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2222/31 - 2021 අප්‍රේල් මස 06 වැනි අඟහරුවාදා - 2021.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 6 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන ම විසින් පනවනු ලබන රෙගුලාසි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 අප්‍රේල් මස 06 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

01. මෙම රෙගුලාසි "**2021 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

02. මෙම ගැසට් පත්‍රයේ අංක 3 රෙගුලාසිය යටතේ ලැයිස්තුගත කර ඇති භාණ්ඩ ආනයනය කිරීම සඳහා රේගු සටහන්කරයක් (රේගු ප්‍රකාශනය/ කස්ඩෙක්) 2021 අප්‍රේල් මස 07 වැනි දින හෝ එදිනට පසුව පිළිගනු නොලැබේ.

03. සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළකරන ලද 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* **IV උපලේඛනය** ට, පහත සඳහන් අයිතම සහ ඊට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

1A - PG 2807 — 500 (2021/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | *I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව ආනයන තහනම **(B)*** |
|---|---|---|---|---|---|
| **12** | **15.11** | | | **ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ පාම් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්** | |
| | | 1511.10.00 | - | ශුද්ධ නොකළ තෙල් | **B** |
| | | 1511.90.00 | - | අනෙකුත් : | |
| | | 1511.90.20 | --- | ලීටර් 210 හෝ ඊට අඩු ප්‍රමාණයන්ගෙන් අසුරා ආනයනය කරනු ලබන පාම් තෙල් | **B** |
| | | 1511.90.90 | --- | අනෙකුත් පිරිපහදු කළ විරන්ජනීකෘත සහ සුගන්දහරණය කළ (ආර්.බී.ඩී) පාම් ඔලීන් හැර | **B** |

04. සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළකරන ලද 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* **I උපලේඛනය** ට, පහත සඳහන් අයිතම සහ ඊට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| | *I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව ආනයන පාලන බලපත්‍ර **(L)*** |
|---|---|---|---|---|---|
| **250** | **15.11** | | | **ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ පාම් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්** | |
| | | 1511.90.00 | - | අනෙකුත් : | |
| | | 1511.90.10 | --- | කාමර උෂ්ණත්වයේ ඇති අනුක්‍රමික කොටස් (පාම් ස්ටියරින්) | **L** |
| | | 1511.90.30 | --- | ශුද්ධ නොකළ පාම් ඔලේන් | **L** |
| | | 1511.90.90 | --- | අනෙකුත් (පිරිපහදු කළ විරන්ජනීකෘත සහ සුගන්දහරණය කළ (ආර්.බී.ඩී) පාම් ඔලීන් පමණි) | **L** |

05. සංශෝධිත, 2020 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පළකරන ලද 2020 ජූලි මස 16 දිනැති අංක 2184/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* **II උපලේඛනයේ** සඳහන් පහත සඳහන් අයිතම සහ ඒවාට අනුරූප සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| | I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IV තීරුව ණය පදනම මත (C) | |
|---|---|---|---|---|---|---|
| | | | | | දින 90 | දින 180 |
| **11** | **15.11** | | | **ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ පාම් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්** | | |
| | | 1511.10.00 | - | ශුද්ධ නොකළ තෙල් | | C |
| | | 1511.90.00 | - | අනෙකුත් : | | |
| | | 1511.90.20 | --- | ලීටර් 210 හෝ ඊට අඩු ප්‍රමාණයන්ගෙන් අසුරා ආනයනය කරනු ලබන පාම් තෙල් | | C |
| | | | | | | |

06. පහත සඳහන් රෙගුලාසිය 2017 නොවැම්බර් මස 09 දිනැති අංක 2044/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* රෙගුලාසි අංක 5 ලෙස ඇතුළත් කෙරේ.

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂක ජනරාල් සහ දේශීය බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරනු ලැබිය යුතුය.

07. සංශෝධිත, විශේෂ ආනයනය හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු පළකරන ලද 2016 පෙබරවාරි මස 11 දිනැති අංක 1953/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* **I උපලේඛනය** ට, පහත සඳහන් අයිතම සඳහා ගෙවිය යුතු ආනයන පාලන බලපත්‍ර ගාස්තු මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| *අංකය* | *අයිතමය* | *ආනයනය පාලන බලපත්‍ර ගාස්තුව* |
|---|---|---|
| **62** | පාම් තෙල් | මි.ර.ගැ. වටිනාකමින් 0.4% |

08. මෙම රෙගුලාසි 2021 අප්‍රේල් මස 07 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.